ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල - 2023
-----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 23(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා අරමුදල විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයට පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් නියෝජනය කරන්නේද යන්න අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව අරමුදල කටයුතු කර ඇති බව,
- අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (එස්එල්ඒඑස්/එස්එල්එෆ්ආර්එස්)

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත බන්ධිත වෙළුම 2020 මගින් ප්‍රකාශිත මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්ප රාමුවට අනුව, වාර්තාකරණ ආයතනයට අදාළ සියලුම වියදම් සහ වත්කම් හඳුනාගෙන වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, අර්ථසාධක අරමුදලට ඍජුවම අදාළ වන සමාලෝචිත වර්ෂය සඳහා වූ රු. මිලියන 54.44 ක මෙහෙයුම් වියදම් සහ අරමුදල විසින් භාවිත කරන ලද රු. මිලියන 6.73 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 81 ක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්ප රාමුව තුළ මෙම කාරණය වාර්තා කිරීම ඊළඟ මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ආ) මධ්‍යම තැන්පතු පද්ධතියේ අරමුදලේ නමින් ආයෝජනයට අදාළ සුරැකුම්පත් නොමැති වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව පැහැර හරින ලද පොලී ඇතුළුව ලැබිය යුතු මුළු මුදල රු. මිලියන 2,772.76 ක් වන එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීහි සිදු කළ ආයෝජනයේ ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත ය. තවද, මෙම කාරණාව මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 11.2 යටතේ අනාවරණය කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එස්එල්එෆ්ආර්එස් 09) වගන්ති අංක 5.5 ප්‍රකාරව ආයෝජනයේ අපේක්ෂිත ණය පාඩුව විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සම්පූර්ණ හානිකරණ ප්‍රතිපාදන සැලසීම වෙනුවට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 615.28 ක හානිකරණ ප්‍රතිපාදනයක් පමණක් සලසා තිබුණි. | විෂය කරුණ සම්බන්ධයෙන් වන නඩුව විභාග වෙමින් පවතින බැවින් සහ අරමුදලේ වාර්ෂික ආදායම් ප්‍රකාශය හරහා එකී ආයෝජනය මත සිදුවන යම් හානිකරණ අලාභයකට එරෙහිව ආයෝජන සංචිතයක් නිර්මාණය කර ඇත. 2022 දෙසැම්බර් 31 අවසන් වන විට එම සංචිතය රු. 2,157,483,000 ක් විය. | -එම- |
| (ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද 2023 දෙසැම්බර් 31 දිනට පැහැර හරින ලද බදු වාර්තාවට අනුව, 2018/2019 තක්සේරු වර්ෂය සඳහා ආයතනික ආදායම මත පැහැර හරින ලද බදු පොලිය ලෙස අරමුදල විසින් රු. මිලියන 913.07 ක් පියවිය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැම්ස් පද්ධතිය යාවත්කාලීන නොවීම හේතුවෙන් අධීක්ෂණයක් මගින් තක්සේරුව නිකුත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් | -එම- |

| | | |
|---|---|---|
| යුතුය. කෙසේ වෙතත්, අරමුදල එය සමඟ එකඟ නොවූ අතර මෙම ආරවුල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාවත් විසඳී නොතිබුණි. එසේ වුවද, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්කේඒඑස් 12) වගන්ති අංක 88 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වන අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල මෙම ආරවුල හඳුනාගෙන හෝ අනාවරණය කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට නිසි ලෙස දන්වා ඇත. එබැවින්, ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්කේඒඑස් 37) 86 වැනි වගන්තියට අනුව අසම්භාව්‍ය වගකීමක් නොමැති අතර අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය හෙළිදරව් කිරීමට අවශ්‍ය නොවේ. | |
| (ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2022 පෙබරවාරි 01 දින එවන ලද ලිපියට අනුව, එකතු කළ අගය මත බදු පනතේ 25 ඒ වගන්තියට අනුව 2022 පෙබරවාරි 15 දින හෝ ඊට පෙර මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වන ලෙස අරමුදලට දැනුම් දී තිබුණු අතර එකතු කළ අගය මත බදු පනතේ 25 ඒ වගන්තියේ 3 වන උපවගන්තියේ විධිවිධානයේ දක්වා ඇති පරිදි ලියාපදිංචි වීමට අපොහොසත් වීම බලෙන් ලියාපදිංචි කිරීමට බල කෙරෙනු ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අරමුදල මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි කර නොතිබූ අතර, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්කේඒඑස් 12) 88 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වන අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල මෙම ආරවුල අනාවරණය කර නොතිබුණි. | 2022.02.21 දිනැති එෆ්එම්/ජ්එෆ්එම්ටීඑම්/ඩීඑෆ්එම් (බදු)/ අර්ථසාධක අරමුදල දරන ජ්එෆ්එම්ටීඑම් ලිපිය මගින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් වෙත මෙම කරුණ යොමු කර ඇත. ඊට අමතරව ඩීඑෆ්එම් (පීඑෆ්) විසින් 2022.04.26 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම් වෙත මෙම ගැටලුව යොමු කර ඇත. එබැවින්, ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්කේඒඑස් 37) 86 වැනි වගන්තියට අනුව අසම්භාව්‍ය වගකීමක් නොමැති අතර අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය හෙළිදරව් කිරීමට අවශ්‍ය නොවේ. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2024 පෙබරවාරි 13 වැනි දින ගන්නා ලද කළමනාකරණ කමිටු තීරණය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශවලින්, 2024 ජනවාරි 01 සිට 2024 පෙබරවාරි 13 වැනි දින දක්වා විශ්‍රාම ගිය සාමාජිකයන්ට අදාළව රු. මිලියන 122 ක් වූ ලාභාංශ සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබූ අතර එම මුදල 2023 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපැයීම්වල ශේෂයෙන් නියෝජනය විය. | 2023 සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කරන විට මෙම සාමාජිකයින් විශ්‍රාම ගිය බැවින්, එම ලාභාංශ මුදල රඳවාගත් ඉපැයීම්වලට ඇතුළත් වේ. | සමාලෝචිත වර්ෂය සඳහා ලාභාංශ ප්‍රකාශ කර සුදුසුකම් ලත් සියලුම සාමාජිකයින් සඳහා ලබා දිය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2024 මාර්තු 03 වැනි දින අරමුදලට ලැබී තිබූ සමාලෝචිත වර්ෂය තුළදී පරිණත කැඳවීම් තැන්පතුවල පොලී ආදායම රු. මිලියන 1.88 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු පොළිය ලෙස නොපෙන්වා ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ආයෝජනයක් ලෙස වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර අනෙකුත් ලැබිය යුතු මුදල් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය මහජන බැංකුව විසින් අත්හරින ලද මහජන බැංකුවේ ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පතු අංක: 204-60-01-000350061-2 ට අදාළ රු. මිලියන 1.9 ක පොලී ආදායම වේ. සිහි කැඳවීම් කිහිපයකින් පසුව එම මුදල 2024 මාර්තු 03 වන දින අරමුදලේ බැංකු ගිණුමට බැර කරන ලදි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉවත් කළ සහ සේවය හැර ගිය සාමාජිකයින්ගේ සාමාජික ශේෂයන් නොපියවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට සාමාජික ශේෂයන්ට එරෙහිව ලබා දුන් ණයවලින් අක්‍රීය සාමාජිකයන් 128 දෙනෙකුගෙන් රු. මිලියන 19.06 ක් වසර 3 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. එම මුදලින් අක්‍රීය සාමාජිකයන් 34 දෙනෙකුගෙන් රු. මිලියන 9.5 ක් සහ අක්‍රීය සාමාජිකයන් 86 දෙනෙකුගෙන් රු. මිලියන 2.4 ක් පිළිවෙලින් වසර 7 කට සහ වසර 31 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. | අක්‍රීය සාමාජිකයින් සඳහා ලබා දුන් ණය ද අපගේ ගිණුම් පොත්වල සටහන් කර ඇති අතර අක්‍රීය සාමාජිකයින්ගේ අවසන් පියවීම් නිරවුල් කිරීමේදී එය නිරවුල් කරනු ඇත. | අක්‍රීය සාමාජිකයින්ගේ දිගුකාලීන හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අදාළ සාමාජිකයින්ගේ සාමාජික ශේෂයන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ඉවත් කළ සාමාජිකයින් 588 දෙනෙකුට අයත් රු. මිලියන 107 ක් වසර 3 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතුව පැවතුණි. එයින් ඉවත් කළ සාමාජිකයින් 307 දෙනෙකුට රු. මිලියන 56.8 ක් සහ ඉවත් කළ සාමාජිකයින් 124 දෙනෙකුට රු. මිලියන 1.9 ක් පිළිවෙලින් වසර 7 කට සහ වසර 31 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතුව පැවතුණි. | අදාළ සාමාජිකයින්ගේ සාමාජික ශේෂයන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ශේෂයන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල පවතී. එබැවින්, අරමුදලේ වගකීම තවමත් පවතින බැවින් මෙම ශේෂයන් කපා හැරිය නොහැක. | දිගුකාලීන හිඟ සාමාජික ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවය හැර ගිය සාමාජිකයින් 305 දෙනෙකුට මුළු මුදල රු. මිලියන 5.1 ක් වසර 6 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතුව පැවතුණි. | අවසන් පියවීම් නිරවුල් කිරීමේදී එය නිරවුල් කරනු ඇත. | දිගුකාලීන හිඟ සාමාජික ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) අර්ථසාධක අරමුදල් රෙගුලාසි | | | |
| (i) රීති අංක 04 | සෑම සාමාජිකයෙකුම සහ සේවා යෝජක විසින් සේවකයාගේ වැටුපෙන් හෝ වේතනයෙන් පිළිවෙලින් සියයට 10 ක් සහ සියයට 15 ක් අරමුදලට දායක විය යුතුය. මූලික වැටුප් නිර්වචනයට පටහැනිව, අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ ඉහළම දීමනාව ඇතුළු වැටුප සලකා බලා තිබුණි. | අර්ථසාධක අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී, 2007 ඔක්තෝම්බර් 23 දිනැති පුද්ගල චක්‍රලේඛ අංක: ඩීජීඑම්(පී)/පොලිසි/ජීඑස්(1)/181 ට අනුකූලව, ඒකාබද්ධ වැටුපට අමතරව ඉහළම දීමනාවක් සලකා බලා ඇත. | අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ii) රීති අංක 22 | i. මෙම විධිවිධානයට පටහැනිව, පෙර වර්ෂය අවසන් වන දිනට පැවති සාමාජිකයින්ගේ බැර ශේෂයන් මත පදනම්ව ලාභාංශ ගෙවීම වෙනුවට සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට පැවති සාමාජිකයින්ගේ බැර ශේෂයන් මත පදනම්ව ලාභාංශ ගෙවා තිබුණි. තවද, මෙම විධිවිධානයට පටහැනිව, 2022 දෙසැම්බර් 31 වන දිනට එම සාමාජිකයින්ගේ බැර ශේෂය මත පදනම්ව 2022 දෙසැම්බර් 31 දින විශ්‍රාම ගිය සාමාජිකයින් 285 දෙනෙකුට 2022 වර්ෂය සඳහා ලාභාංශ ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | සාමාජිකයා විශ්‍රාම ගොස් ඇති පසුගිය වසරේ දායකත්වය සඳහා ලාභාංශ රැස් නොකෙරේ, එබැවින් රීති අංක 22 මගින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල වේ. | -එම- |
| | ii. මෙම ප්‍රතිපාදනයට පටහැනිව, 2023 ජනවාරි 01 දිනට රඳවාගත් ඉපැයීම්වල සහ සමාලෝචිත වර්ෂය සඳහා | සංචිත හා ප්‍රතිපාදන නිර්මාණය කිරීමෙන් පසුව සහ අරමුදලට අය කළ හැකි වියදම් අඩු කිරීමෙන් පසුව ලාභාංශ | -එම- |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂා කිරීමේ පිරිවැය සහ බදු පමණක් අඩු කිරීමෙන් පසු ශුද්ධ ලාභයේ එකතුව වූ රු. බිලියන 13.29 ක් සාමාජිකයින් අතර සම්පූර්ණයෙන්ම බෙදා හැර තිබුණි. | ගණනය කිරීම නිසි ලෙස සිදු කරයි. | |
| (iii) රීති අංක 31 | කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් මගින් මින්මතු ඕනෑම අවස්ථාවක දී කලින් කලට හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම රීති හෝ ඒවායින් යමක් විවර්තනය කිරීම, වෙනස් කිරීම, විකරණය කිරීම, නැවත සෑදීම හෝ පරිච්ජින්න කිරීම නීත්‍යානුකූල විය යුතුය. අධ්‍යක්ෂක මණ්ඩලයේ, කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය නොමැතිව සහ 2003 අර්ථසාධක අරමුදල් රෙගුලාසිවල සංශෝධන ගැසට් නිවේදනයක් හරහා ප්‍රකාශයට පත් නොකර, කළමනාකරණ කමිටුවේ බලතල හා රාජකාරි, ආයෝජන බලතල, සාමාජිකයින්ට ණය ලබා දීම යනාදියට අදාළ රීති අරමුදල විසින් සංශෝධනය කර ඒ අනුව කටයුතු කර තිබුණි. | 2024 පෙබරවාරි 14 වැනි දින පැවති අර්ථසාධක අරමුදල් කළමනාකරණ කමිටු රැස්වීමේදී අරමුදලේ පවතින රීති සහ රෙගුලාසිවලට අවශ්‍ය වෙනස්කම් සමාලෝචනය කර නිර්දේශ කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇත. කමිටු වාර්තාව ඉදිරිපත් කළ පසු අරමුදලේ පවතින රීති සහ රෙගුලාසි සංශෝධනය කරනු ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 15,580.82 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 10,684.14 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 4,896.68 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය තුළදී පොලී ආදායම රු. මිලියන 4,890.85 කින් වැඩි වීම ප්‍රධාන හේතුව වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| ආදායම/වියදම | 2023 | 2022 | වැඩිවීම / (අඩුවීම) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| පොලී ආදායම | 15,566 | 10,675 | 4,891 | 46 |
| අනෙකුත් ආදායම | 28 | 18 | 10 | 55 |
| අනෙකුත් මෙහෙයුම් වියදම | 13 | 9 | 4 | 44 |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සහ පසු ගිය වර්ෂය සඳහා අරමුදලේ වැදගත් අනුපාත කිහිපයක් පහත සඳහන් වේ.

| අනුපාත | 2023 % | 2022 % |
|---|---|---|
| --------- | ------- | ------- |
| ශුද්ධ ලාභ අනුපාතය (පීඒටී) | 85.26 | 91.11 |
| සාමාන්‍ය ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය | 23.37 | 13.71 |
| සාමාජිකයින්ගේ ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය | 14.38 | 11.65 |
| අවසාන සාමාජික ශේෂය මත ලාභාංශ ප්‍රකාශන අනුපාතය | 16.12 | 12.84 |

සාමාන්‍ය ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය, සාමාජිකයින්ගේ ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය සහ අවසාන සාමාජික ශේෂය මත ලාභාංශ ප්‍රකාශන අනුපාතය වර්ෂය තුළදී ආයෝජන සඳහා වන පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළ දැරූ රු. මිලියන 2,285.97 ක ආදායම් බදු (2022 දී රු. මිලියන 941.9 කි) හේතුවෙන් වර්ෂය සඳහා ශුද්ධ ලාභ අනුපාතය පෙර වසරට සාපේක්ෂව සියයට 5.85 කින් අඩු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 සහ 2009 වර්ෂවල එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා භාණ්ඩාගාර බැඳුම්කර තුනක රු. බිලියන 2.3 ක් ආයෝජනය කර තිබූ අතර මධ්‍යම තැන්පතු පද්ධතියේ අරමුදලේ නමින් මෙම ආයෝජනයට අදාළ සුරැකුම්පත් නොමැති බව 2015 වර්ෂයේදී අනාවරණය විය. කෙසේ වෙතත්, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් කාලීනව ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි. තවද, 2015 දෙසැම්බර් 09 වැනි දින එන්ට්‍රස්ට් සිකියුරිටීස් | මෙම ආයෝජනයේ මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ සිවිල් නඩුවක් ආරම්භ කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ නීති අංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම | (i) අනාගතයේදී එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ඇති බවට සහතික විය යුතුය.<br>(ii) සිදු වූ පාඩුව අයකර ගැනීමට සියලු සාධාරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික විය යුතුය. |

| | | |
|---|---|---|
| පීඑල්සීට එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව නඩුවක් පවරා තිබුණි. තවද, මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී අයකර ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව 2018 වර්ෂයේදී සිවිල් නඩුවක් ගොනු කර තිබුණි. 2018 සහ 2019 වසරවල පරිණත වූ ආයෝජනවල මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී වටිනාකම රු. බිලියන 2.8 ක් වූ අතර නඩු දෙකම විභාග වෙමින් පවතී. | වැටුප් අරමුදල සමාගමේ ඈවර කිරීමේ ක්‍රියාවලියට පාර්ශවකරුවෙකු කරමින් නඩු අංක ඩීඑම්ආර්/1405/2018 සහ ඩීඑම්ආර්/1029/2018 යන සිවිල් නඩු දෙක ඉදිරියට කරගෙන යාමට කොළඹ දිසා අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. | (iii) වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා පියවර ගත යුතුය. |